museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

**MMCA ශ්‍රී ලංකා WAC අධිශිෂ්‍යත්වයේදී Web3 විසදුම් ගොඩනගයි**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) සහ ලොව පුරා ඇති වෙනත් සංස්කෘතික ආයතන එකොළහක්, පැරිස් සහ බර්ලින් පදනම් කරගත් We Are Museums මෙහෙයවූ Web3 for the Arts and Culture (WAC) අධිශිෂ්‍යත්වය සාර්ථකව සම්පූර්ණකළේ ය.

මෙම වැඩසටහන යටතේ පිරිනැමූ දෙවන සිව්මස් නවෝත්පාදන පර්යේෂණාගාරය මෙයවූ අතර, මෙහිදී මෙම ආයතනවලට Web3 හඳුන්වාදීමට මාර්ගගත පුහුණුව සහ උපදේශනය ලබා දෙන ලදී. තව ද, සහභාගිවන්නෝ බ්ලොක්චේන් පාදකකරගත් ව්‍යාපෘති ගවේෂණයකරමින් මුලාකෘති නිමැවූ අතර, 2023 මැයි 25 දින මාර්ගගත ක්‍රමයට පැවත්වූ ආදර්ශන දිනයේදී ඒවා ඉදිරිපත්කළෝ ය.

MMCA ශ්‍රී ලංකා කාර්යමණ්ඩල සාමාජිකයන්වන සහාය අභිරක්ෂක (ප්‍රදර්ශන) රිචෙල් මාසලින් සහ තිනාල් සජීව, කණ්ඩායම්ගතව තාක්ෂණික අනුකලකයක් භාවිතාකරගනිමින්—බ්ලොක්චේන් සහ UI/UX ප්‍රවීණයන්ගේ සහාය ඇතිව—වැඩසටහනේ අවසන් මාසය කැපකළේ ඔවුන්ගේ ම බ්ලොක්චේන් යෙදුමක් මුලාකෘතිකිරීමට සහ සංවර්ධනයකිරීමටයි. “අපේ ‘Museum of School’ නම් අවසාන ව්‍යාපෘතියට MMCA ශ්‍රී ලංකා බාහිර අධ්‍යාපනඥයින් සඳහා විශේෂයෙන් නිර්මාණයකර ඇති මූලාකෘති ඉගෙනුම් සහ පුහුණුකිරීම් ද්වාරයක් සැකසීම ඇතුළත්වෙනවා. කලාකෘති සුරක්ෂණය සහ පරිහරණය, නිරීක්ෂණය හා සෙමෙන් බැලීමේ ක්‍රම, සහ අමුත්තන් ඵලදායී ලෙස සම්බන්ධකරගැනීමේ ක්‍රම ඇතුළු විවිධ පාඨමාලා සම්පූර්ණකිරීම උදෙසා දිරිගැන්වීම් ලෙස NFT එකතුකිරීම් මෙම ක්‍රියාමාර්ගයට ඇතුළත්කරලා තියෙනවා” යැයි සජීව සඳහන්කළේ ය. “MMCA ශ්‍රී ලංකා අභ්‍යන්තර කාර්යමණ්ඩලය, විශේෂයෙන් බාහිර අධ්‍යාපනඥයින්, ඉලක්කකර ගනිමින් ආරම්භවුවත් මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ ආයතන, කෞතුකාගාර, පාසල්, සහ මුළු දකුණු ආසියානු කලාපය පුරාවටත් පුළුල්ව ක්‍රියාත්මක කරන්න පුළුවන්” යැයි ඔහු වැඩිදුරටත් පැවසීය.

WAC අධිශිෂ්‍යත්වයේදී තමන් ලැබූ අත්දැකීම් පිළිබඳ සජීව පැවසුවේ, “WAC අධිශිෂ්‍යත්වය Web3 තාක්ෂණයේ ඇති සංකීර්ණතා ගවේෂණයකිරීමට වටිනා අවස්ථාවක් ලබාදුන්නා. වැඩසටහනේ ව්‍යූහගත සහ ක්‍රමානුකූල ප්‍රවේශය

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

සතිපතා පැවැත්වූ සැසි පිටුපස ඇති පුළුල් දැක්ම ග්‍රහණයකරගැනීමට මං සැලැස්වූවා,” යනුවෙනි.

WAC අධිශිෂ්‍යත්වයට සහභාගිවූ අනෙක් ආයතන අතර Australian Centre for the Moving Image (ඕස්ට්‍රේලියාව), Belvedere Museum (ඔස්ට්‍රියාව), Haus der Kunst München (ජර්මනිය), House of Electronic Arts (ස්විට්සර්ලන්තය), ප්‍රංශ සංස්කෘතික අමාත්‍යාංශය (ප්‍රංශය), Institute for Sound and Music (ජර්මනිය), Musée d'Orsay හා Musée de l'Orangerie (ප්‍රංශය), National Taras Shevchenko Museum (ArtAegis සහ නවීන කලා පර්යේෂණ ආයතනය සමඟ හවුල්ව) (යුක්රේනය), The Reel Store (එක්සත් රාජධානිය), The Royal College of Art (එක්සත් රාජධානිය), හා Wooko Makandie Foundation (නෙදර්ලන්තය) ඇතුළත්වෙයි.

මෙම වැඩසටහන හරහා සංස්කෘතික අංශය තුළ බ්ලොක්චේන්හි භූමිකාව, ඉන් අනන්‍යතාවට ඇතිවන බලපෑම, ආරක්ෂක, නීතිමය හා සමාජීය බලපෑම්, පරිගණක ක්‍රීඩා, මෙටාවර්ස්, Web3 සන්නිවේදන, සහ ප්‍රජා ගොඩනැගීම ආවරණය විය. සමස්තයක් ලෙස, සාමාජිකයින්ට පුහුණුකරුවන් 25ක්, උපදේශකයින් 50ක්, පාඩම් 35ක්, ප්‍රායෝගික අභියෝග 10ක්, සහ ප්‍රත්‍යේක අධ්‍යයන 15කට ප්‍රවේශය හිමි විය. “WAC අධිශිෂ්‍යත්වය සංස්කෘතික රූපාන්තරණයක පුමුඛස්ථානයේ සිටිනවා මෙන් ම, බ්ලොක්චේන් තාක්ෂණයේ අතිවිශාල විභවය උපයෝගීකරගැනීමට ආයතන සවිබලගන්වනවා” යැයි We Are Museums සහ WAC-Labහි නිර්මාතෘ ඩයෑන් දෑබේ පැවසීය.